# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1865/37 - 2014 ජුනි මස 06 වැනි සිකුරාදා - 2014.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී/11/2009(II).

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත**

27අ(4) වැනි වගන්තිය යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27අ(4) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මේ නියමය මගින් -

(අ) 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරා දී ඇත්තා වූ ද, මේ නියමයේ පළමු වැනි උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇත්තා වූ ද, ලේල්වල වත්ත යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම හා සම්බන්ධ 1982 පෙබරවාරි මස 27 වැනි දින අංක 181/12 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27අ(1) වැනි වගන්තිය යටතේ කරන ලද නියමයේ මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ලේල්වල වත්ත නමැති ඉඩමේ බිම් ප්‍රමාණයට අදාළ වන්නා වූ කොටස ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරනු ලැබීම සඳහා වූ ප්‍රතිෂ්ඨාවට අදාළ නියම හෝ කොන්දේසි අනුව ක්‍රියා කර නොමැති වීමේ පදනම මත ප්‍රත්‍යාදිෂ්ට කිරීම මගින් එකී නියමය මෙයින් සංශෝධනය කරමි ; සහ

(ආ) මේ ප්‍රත්‍යාදිෂ්ට කිරීම මත මේ නියමයේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඉඩම් ප්‍රමාණය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත පැවරෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

**පළමුවන උපලේඛනය**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරා ඇති ලේල්වල වත්ත නම් ඉඩමේ විස්තරය

| *අති විශෙෂ ගැසට් පත්‍රයේ අංකය සහ දිනය* | *වතු ඉඩමේ නම* | *පරිපාලන දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරන ලද ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර්වලින්* |
|---|---|---|---|---|
| 1982.02.27 දින හා අංක 181/12 | ලේල්වල වත්ත | ගාල්ල | බද්දේගම | 451.14 |

1A - G 19678— 65 (2014/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## දෙවන උපලේඛනය

### ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත පැවරෙන ඉඩම් කොටසෙහි විස්තර

| *නිශ්චිත අංකයන්* | *ඉඩමේ නම* | *පරිපාලන දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරී කොට්ඨාසය* | *ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව නැවත පැවරෙන ඉඩම් ප්‍රමාණය* |
|---|---|---|---|---|---|
| කො/1074<br>කො/1091<br>කො/1087<br>කො/1071<br>කො/1225<br>කෑ/52 | ලේල්වල වත්ත | ගාල්ල | බද්දේගම | අංක 191/සී දෙයියන්දර | ගාල්ල දිසා අධිකරණ බූදල් නඩු අංක ටී/9710 දරන නඩුව සඳහා බලයලත් මානක උසාවි කොමසාරිස් ජී. ඊ. පලිහපිටිය මානක විසින් මැන සකසන ලද අංක 746 සහ 2010.07.15 දිනැති පිඹුරේ කැබලි අංක A සහ B කොටස් වලින් සමන්විත අක්කර 03, රූඩ් 0, පර්. 00 (හෙක්ටයාර් 1.21405) කින් යුත් ඉඩම් කොටස |

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 මැයි මස 30 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

06-613

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.